**ශීර්ෂය 331 - දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 331 - දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ඇවර කිරීමේ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 27 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 58,257.92 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 54,646.42 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3,611.50 ක් හෙවත් සියයට 6.20 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 57,010.32 | 53,463.06 | 3,547.26 | 6.22 |
| මූලධන | 1,247.60 | 1,183.36 | 64.24 | 5.15 |
| එකතුව | **58,257.92** | **54,646.42** | **3,611.50** | **6.20** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 33101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 300.00 | 263.53 | 225.00 | 276.66 | 700.00 | 44.94 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0431/0016/000 දරන අග්‍රිම ගිණුමෙහි 2016 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.මිලියන 32.30 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වූ පොදු තැන්පත් ගිණුම් 05 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 2,550.19 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0002/0168/000 | 1.74 |
| 6000/0000/00/0013/0123/000 | 2,541.59 |
| 6000/0000/00/0016/0113/000 | 5.30 |
| 6000/0000/00/0018/0111/000 | 1.50 |
| 6000/0000/00/0020/0019/000 | 0.06 |
| **එකතුව** | **2,550.19** |

## 2.5 විගණන නිරීක්ෂණය

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 802 හා 1647 (ඈ) සහ (ඉ) | පවත්වා නොතිබුණි. |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (iii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

### 3.2 විගණන සාක්ෂි නොවීම

2013 අංක 01 දරන දිවිනැගුම සංවර්ධන පනත යටතේ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ කළ යුතුව තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට වූ ඇවර කිරීමේ ගිණුමේ ඇතුළත් රු.20,707,713 ක් වටිනා ලිපිද්‍රව්‍ය හා වෙළඳ තොගවලට අදාළ තොග පොත් හා තොග සමීක්ෂණ වාර්තා සහ දෙපාර්තමේන්තුවට සේවා ලබාගන්නා ලද ආයතන 03 ක තැන්පත් කර තිබූ එකතුව රු.179,000 ක් වූ තැන්පතු ශේෂ පවරා ගැනීමේ ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එම වත්කම් නිවැරදිව දෙපාර්තමේන්තුවට පවරාගත් බවට විගණනයේදී සනාථ කර ගැනීමට නොහැකි විය.

### 3.3 විගණන විමසුම්වලට පිළිතුරුදීම

දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබූ අතර ප්‍රමාද කාලය මාස 2 ක සිට මාස 15 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 102.7 ක් විය.

### 3.4 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 19 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු එකතුව රු. මිලියන 70.68 ක් ඉතිරි වී තිබුණි. එය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය නොවූ සහානාධාර රු.මිලියන 57.05 ක් වැය විෂයයට අධිභාර කර නොතිබුණි. එමෙන්ම ඉකුත් වර්ෂයේ උපලබ්ධි නොවූ තැන්පත් රු.මිලියන 24.7 ක් සමාලෝචිත වර්ෂයේ සහානාධාර වියදම් ගිණුමට ගළපා තිබුණි. මේ හේතුවෙන් රු.මිලියන 40,740.17 ක සහනාධාර වියදමේ නිවැරදිතාවය සනාථ කර ගැනීමට නොහැකි විය.

## 3.5 පොදු තැන්පත් ගිණුම

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිවි නැගුම සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීමේ අයදුම්පත් ගාස්තු වශයෙන් රැස්කළ රු105.,367,බැර නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙනක් ඒකාබද්ධ අරමුදලට 500 තිබුණි. එම තැන්පත්වලින් ගෙවීම් කළ පසු සමාලෝචිත වර්ෂය අවසාන වන විට ශේෂය රු34.,367, 500 ක් වී තිබුණි.

(ආ) ක්ෂුද්‍ර මූල්‍ය බැංකු අංශයේ කාර්යයන් සඳහා පොදු තැන්පත් ගිණුමක් මඟින් කටයුතු කිරීමට අවශ්‍ය අනුමැතිය භාණ්ඩාගාරයෙන් ලබා නොගෙන බැංකු අංශයේ ලැබීම් රු.9,000,000 ක් හා වියදම් රු.8,569,348 ක් තැන්පත් ගිණුමක තැන්පත් ලැබීම් හා ගෙවීම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේදී සමෘද්ධි සහනාධාර ගෙවීම සඳහා බැංකු මූල්‍ය අංශයේ ආයෝජනවලින් ලබාගත් ආපසු නොපියවූ රු.2,449,502,627 ක ශේෂය පියවිය යුතු බැරකමක් වුවද, එය පොදු තැන්පත් ගිණුමට ඇතුළත් කර තිබුණි.

(ඈ) 2014 වර්ෂයේ දී ඒකාබද්ධ වූ ආයතනවල වියදම් වෙනුවෙන් රු.2,982,636 ක් වටිනා චෙක්පත් නිකුත් කර තිබුණු අතර ගෙවීම් සඳහා බැංකුව වෙත ඉදිරිපත් වී නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම චෙක්පත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

----------------------------------------

විෂය අංක 33101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරුවී ගිය, මියගිය, වැඩ තහනම් කිරීම හා සේවයෙන් පහකළ නිලධාරීන් 100 ක ගෙන් හිඟහිට ණය ශේෂවල එකතුව රු.2,662,770 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 04 ක සිට වර්ෂ 19 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) 2002 හා 2003 වර්ෂවලදී ස්ථානමාරු වී පැමිණි නිලධාරීන් 03 දෙනෙකු ඇතුළුව නිලධාරීන් 09 දෙනෙකුගේ හිඟහිටි ණය ශේෂවල වටිනාකම රු. 746,964 ක් වී තිබුණි. එම ණය ශේෂ අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ නිලධාරීන් 24 දෙනෙකුගේ ණය ලිපිගොනු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබීම නිසා එම නිලධාරීන්ගෙන් හිඟහිටි රු.1,268,663 ක ණය ශේෂයන්හි නිවැරදිතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

**3.7 ණය චක්‍රීය අරමුදල**

**--------------------**

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව තිබූ ණය චක්‍රීය අරමුදලට ලැබිය යුතු ණය ශේෂය රු.මිලියන 130.16 ක් වූ අතර එම ණය ශේෂය අයකර ගත් බවට තොරතුරු සනාථ කර නොතිබුණි. මෙම ණය චක්‍රීය අරමුදල තවදුරටත් පවත්වා ගෙන යාම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**3.8 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**---------------------------------------**

**3.8.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**--------------------------------**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශයන් ප්‍රකාරව සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැසුම් හා ප්‍රසම්පාදන කාල සටහන් පිළියෙල කර නොතිබුණි.

**3.8.2 අභ්‍යන්තර විගණනය**

**----------------------**

අභ්‍යන්තර විගණන අංශය විසින් සමාලෝචිත වර්ෂයේ දී ඉටු කිරීමට සැලැසුම් කළ ප්‍රධාන කාර්යාලයේ විෂය ක්ෂේත්‍ර 16 ක කාර්යයන් 115 කින් විෂයය ක්ෂේත්‍ර 12 ක කාර්යයන් 106 ක් ඉටුකර නොතිබුණි.

**3.9 වත්කම් කළමනාකරණය**

**----------------------------**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) **වත්කම් පවරා ගැනීම හා නඩත්තු කිරීම**

**---------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ කරන ලද අධිකාරි 03 ක් හා දෙපාර්තමේන්තු 02 ක් විසින් ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර පවත්වා නොතිබීම නිසා 2013 දෙසැම්බර් 31 දිනට එම ආයතන ඇවර කිරීමේ ගිණුම්වල ඇතුළත් කර දෙපාර්තමේන්තුවට පවරා ගන්නා ලද එකතුව රු.මිලියන 2,340.26 ක් වූ ස්ථාවර වත්කම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ii) දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරි 03 හි 2013 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශවල අයවිය යුතුව පැවති පිළිවෙලින් රු.මිලියන 289.03 ක්, රු.මිලියන 26.58 ක් හා රු.මිලියන 0.64 ක් වශයෙන් එකතුව රු.මිලියන 316.25 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් දෙපාර්තමේන්තුව විසින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තාව 2017 ජුනි 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, ප්‍රාදේශිය කාර්යාල 21 ක වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දෙපාර්තමේන්තුව සතු වාහන 04 ක් රේබීය අමාත්‍යාංශය වෙත වර්ෂ 02කට ආසන්න කාලයක සිට ලබා දී තිබුණත්, එම වාහන නඩත්තු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් රු.855,416 ක් වැය කර තිබුණි.

**3.10 බේරුම් නොකළ බැරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය අවසානයට බේරුම් නොකළ බැරකම්වල වටිනාකම රු.මිලියන 7,479.78 ක් වූ අතර, ඉන් රු.මිලියන 7,415.78 ක් වූ බැරකම් වර්ෂ 1 ක සිට වර්ෂ 3 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි.

(ii) වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.මිලියන 4,479.73 ක් බැරකම්වලට එළඹ තිබුණි.

**3.11 අනුකූල නොවීම්**

**(අ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| • මුදල් රෙගුලාසි 135,137 හා 138 | 21,653,387 | ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ කාර්යයන් අවසන් කිරීම සඳහා 2014 ජනවාරි මාසයේ සිට ජුනි මාසය දක්වා කාලය තුළ සිදුකළ ගනුදෙනු සඳහා මූල්‍ය පාලන බලතල පවරා දීමක් |

| | | |
|---|---|---|
| | | සිදුකර නොතිබුණි. මෙම කාලය තුළ ගෙවීම් වවුචර් 309 ක් අනුමත කිරීමකින් හා සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. |
| • මුදල් රෙගුලාසි 371 | 1,123,644 | නිලධාරීන් 29 දෙනෙකුට අවස්ථා 45 කදී තත් කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණත්, එම අග්‍රිමයන් නිරවුල් කිරීම දින 7 ක සිට මාස 07 ක් දක්වා කාල පමාවකින් පසුව නිරවුල් කර තිබුණි. |

(ii) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

------------------------

| | | |
|---|---|---|
| • 2015 ජූලි 15 දිනැති අංක 02/2015 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | | දෙපාර්තමේන්තුවේ වාහන 13 ක් වර්ෂ 03 ක සිට වර්ෂ 09 ක් දක්වා කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව දිරාපත් වීමට ඉඩහැර තිබුණි. |
| • 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන චක්‍රලේඛය | | දෙපාර්තමේන්තුව තුළ පවත්වාගෙන යනු ලබන සමාජ ආරක්ෂණ අරමුදල, නිවාස සංවර්ධන අරමුදල, බැංකු සංගම් ලිපි ද්‍රව්‍ය චක්‍රිය අරමුදල, සේවක ණය චක්‍රිය අරමුදල, දිවි නැගුම අරමුදල, දිවි නැගුම සමාජ ආරක්ෂණ අරමුදල යන අරමුදල් සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබාගෙන ඒවා ව්‍යවස්ථාපිත කිරීමටත්, වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

(ආ) **බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

------------------------------------------

දිවි නැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති අධීක්ෂණය හා නියාමනය කිරීමේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්ට හා දිවි නැගුම ජාතික සභාවේ සාමාජිකයන්ට ගෙවන ලද රු.2,455,291 ක් වූ කමිටු දීමනාවලින් 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සියයට 10 බැගින් ගෙවිය යුතු උපයන විට බදු රු.245,529 ක් අඩුකර ගෙන දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

**3.12** **කාර්යසාධනය**

-----------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ජීවනෝපාය සංවර්ධනයට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා සැලැසුම් කිරීමකින් තොරව රු.මිලියන 90 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. දිස්ත්‍රික්ක 18 ක දිළිඳු ජනතාවගේ යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි අවධානය යොමු නොකර දිස්ත්‍රික්ක 07 ක සංවර්ධන කාර්යයන් සඳහා පමණක් එම ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි.

(ආ) ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් කාර්යයන් 05 ක් ඉටුකර නොතිබූ අතර, කාර්යයන් 03 ක් ක්‍රියාත්මක කර තිබුණත්, අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගෙන නොතිබුණි .

**3.13** **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 395(ඇ) ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ නිල බැංකු ගිණුමේ බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන් පැවැතුණි..

(ආ) ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල 09 ක නිල බැංකු ජංගම ගිණුම්වල 2016 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ වලංගු කාලය මාස 06 ක් ඉක්මවා තිබුණු එකතුව රු.806,638 ක් වටිනා චෙක්පත් 113 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල 02 ක බැංකු සැසඳුම් ප්‍රකාශනවල, හඳුනා නොගත් බැර කිරීම් රු.2,066,851 ක් හා තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මාස 01 ක සිට මාස 11 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන චෙක්පත් 18 ක වටිනාකම රු.3,362,178 ක්ද වී තිබුණි.

**3.14** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාහන 05 ක් හා ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ වාහන 03 ක් දෙපාර්තමේන්තුවට පවරා ගෙන නොතිබුණි. එම වාහනවලින් සමෘද්ධි කොමසාරිස්වරයාට හා කොමසාරිස් (මුදල්) ට වාහන 02 ක් අනුයුක්ත කර තිබුණි.

(ආ) ක්‍රියාකාරි සැලැසුම්වලින් ප්‍රතිපාදන සලසා නොතිබුණු අමාත්‍යාංශ ලේකම්ගේ දැනුම්දීම හා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත මධ්‍යම පළාතේ පාතහේවාහැට ජල යෝජනා ක්‍රමයක් සඳහා 2016 අගෝස්තු මාසයේදී මධ්‍යම පළාත් සභාව වෙත රු.32,500,000 ක් ලබා දී තිබුණි. එම ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාළ යෝජනා ක්‍රමය සඳහා වැය නොකර පළාත් සභාවේ තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් නොවූ කාර්යයක් වූ පහත හේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාසල්වල දරුවන්ට ශිර්ෂාභරණ මිලදී ගැනීම හා රිකිල්ලගස්කඩ බස් නැවතුම්පොළ සංවර්ධනය කිරීම සඳහා මධ්‍යම පළාත් සභාව විසින් පිළිවෙලින් රු.2,030,000 ක් හා රු.12,300,000 ක ඇස්තමේන්තුගත වියදම් සඳහා එකතුව රු.14,330,000 ක ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබුණි.

**3.15 අවිධිමත් ගනුදෙනු**

--------------------

දෙපාර්තමේන්තුව විසින් එළැඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

--------------------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු කැඳවීමකින් තොරව මාණ්ඩලික නිලධාරීන් 140 දෙනෙකුගේ සහභාගීත්වයෙන් එකතුව රු.2,132,030 ක් වැය කර “සමෘද්ධි ව්‍යාපාරයේ නව ගමන් මඟ” සම්බන්ධ වැඩමුළුවක් පවත්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ සැලසුම්ගත කාර්යයක් නොවූ දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ තේමා ගීතය වෙනස් කිරීම හා රූපරාමු එකතු කිරීමේ කාර්යය ඉටුකිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1 (ඇ), 3.8(1) (අ), 2.7.5 හා 2.8.4 මාර්ගෝපදේශවලින් බැහැරව රු.1,040,000 ක් වැය කර තිබුණි.

(iii) දෙපාර්තමේන්තුවේ මාධ්‍ය වැඩසටහන් සඳහා රු.4,000,000 ක ප්‍රතිපාදන උපයෝගී කරගෙන ටැබ් පරිගණක යන්ත්‍ර 250 ක් 2016 දෙසැම්බර් මාසය අවසානයේ හදිසි කාර්යයක් සේ සලකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 මාර්ගෝපදේශයේ සඳහන් කාල සීමාවන්ගෙන් බැහැරව මිලදී ගෙන බෙදාහැරීමට කටයුතු නොකර මාස 03 ක කාලයක් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

**(ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) හඳුනාගත් නිශ්චිත කාර්යක් නොමැතිව එක් දිවි නැගුම ප්‍රජාමූල බැංකුවකින් වාර්ෂිකව රු.10,000 ක් බැගින් රැස්කර ගන්නා ලද මුදල් “බැංකු ප්‍රචාරණ හා ප්‍රවර්ධන අරමුදල” නමින් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන ආයෝජනය කරමින් තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයෝජන ශේෂය රු.30,059,302 ක් විය. එම ආයෝජනවලින් රු.3,799,948 ක් කල්පිරීමට පෙර උපලබ්ධි කරගෙන 2016 අප්‍රේල් මාසයේදී හගුරන්කෙත පැවැත්වූ සූර්යය මංගල්‍යය උත්සවයේ වියදම් ඇතුළුව විවිධ වියදම් සිදු කර තිබුණි.

(ii) සමෘද්ධි සංවර්ධන නිලධාරී පුරප්පාඩු 3771 ක් පිරවීමේ තරඟ විභාගය පැවැත්වීම විධිමත් ලිඛිත ගිවිසුමකින් තොරව රු.97,580,000 ක උපදේශන ගාස්තුව මත රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වෙත පවරා තිබුණි.

(iii) දිවි නැගුම ප්‍රජාමූල බැංකුවල සහ දිවි නැගුම ප්‍රජාමූල බැංකු සමිතිවල මූල්‍ය කටයුතු අධීක්ෂණය හා නියාමනය කිරීමේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්ට පිළිවෙලින් රු.7,500 ක් හා රු.10,000 ක් වශයෙන් 2015 මැයි මාසයේ සිට 2017 අප්‍රේල් මාසය දක්වා එකතුව රු.1,492,500 ක දීමනාවක් ගෙවා තිබුණි. එම කමිටුවේ සභාපති හා ලේකම් වශයෙන් කටයුතු කරන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙකුට වැටුපෙන් 1/3 ක් බැගින් 2016 නොවැම්බර් මාසයේ සිට 2017 අප්‍රේල් මාසය දක්වා රු.190,791 ක දීමනාවක් ද විධිමත් අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගෙවා තිබුණි.

(iv) 2013 අංක 01 දරන දිවි නැගුම සංවර්ධන පනතේ 7(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට සහය වීම සඳහා ස්ථාපිත කර ඇති දිවි නැගුම ජාතික සභාවට පත්කළ සාමාජිකයන්ට දීමනා ගෙවීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දී නොතිබුණි. සමාජිකයන් 11 දෙනෙකුට සභාවාර 23 කට සහභාගීවීම වෙනුවෙන් එක් සභාවාරයකට රු.4,000 ක් බැගින් එකතුව රු.772,000 ක් භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගෙවා තිබුණි.

## 3.16 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 ජනවාරි මාසයේ සිට 2016 ජනවාරි දක්වා වූ කාලය තුළ මහනුවර දිස්ත්‍රික් දිවි නැගුම කාර්යාලයේ රු. 23,406,848 ක මුදල් වංචාවක් සිදු කර තිබුණි. ඒ සඳහා කොළඹ අපරාධ විමර්ශණ අංශයේ පැමිණිල්ලක් ගොනුකර මහනුවර දිසා අධිකරණයේ නඩු පවරා තිබුණි. නමුත් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි සංවර්ධන නිලධාරිණියක් විසින් 2015 වර්ෂයේදී සිදුකර තිබු රු. 1,016,170 ක මුදල් වංචාව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර වංචාකළ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.17 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රාජකාරි නොවන ගමන්වලදී සිදු වූ වාහන අනතුරු 02 ක් සම්බන්ධයෙන් හානි හා පාඩු වාර්තා කිරීම හා මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ පැවැත්වීම සිදුකර නොතිබුණි. එයින් යථා තත්ත්වයට පත්කළ නොහැකි වන පරිදි සම්පූර්ණයෙන්ම හානි වූ වාහනය රියදුරු නොවන වෙනත් අයෙකු විසින් ධාවනය කර තිබීම නිසා රක්ෂණ වන්දි ගෙවීම ප්‍රතික්ෂේප වීමෙන් සිදු වූ පාඩුව ගණනය කර නොතිබුණි.

(ආ) දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ වූ අධිකාරි තුනෙහි නිලධාරීන් 14,403 දෙනෙකු සඳහා ගණනය කළ රු.මිලියන 3,327.66 ක් වූ පාරිතෝෂික මුදල ගෙවීමට භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාදවීම හේතුවෙන් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව සියයට 30

බැගින් ගණනය කළ අධිභාරය රු.998,298,753 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එයින් නිලධාරීන් 3,307 දෙනෙකුට රු.292,041,781 ක අධිභාර ගෙවා තිබුණි.

## 3.18 විසදා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද වලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| | විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|---|
| | **වර්ෂය** | **ඡේද අංකය** | |
| (අ) | 2015 | 3.1 (අ) | මුදල් රෙගුලාසි 845 (1) ප්‍රකාර 26 වැනි පරිශිෂ්ඨය පරිදි රාජකාරි දුරකථන ලේඛනය පවත්වා නොතිබුණි. |
| (ආ) | 2015 | 3.1(ආ) හා 3.10.1(ආ) (iii) | මුදල් රෙගුලාසි 890 හා 891 (1) ප්‍රකාරව රජයේ නිලධාරීන්ගෙන් ඇප තැන්පතු ලබා ගෙන ඇප ලේඛනය පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2015 | 3.1(ඇ) | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි හා පාඩු ඇතුළත් කර හානි පිළිබද ලේඛනය පවත්වා නොතිබුණි. |
| (ඈ) | 2015 | 3.9(ඈ)(i) | සමීක්ෂණ වාර්තාවලින් පෙන්වා දී තිබුණු බැංකු ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ ප්‍රයෝජනයට ගත නොහැකි වටිනාකම රු. 2,395,081 ක් වූ ලිපිද්‍රව්‍ය තොගය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 2015 | 3.9 (ඈ)(ii) | ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය විසින් බදු දී තිබූ ඉඩම් හා ගොඩනැගිලි දේපල 09 ක් දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන අදාළ බදුකරුවන් සමඟ නව ගිවිසුම්වලට එළැඹීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | 2015 | 3.9 (ඊ) (111) | 'ඉසුරුමත් නිවහනක්' වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේ සිට රු.මිලියන 2,992.78 ක බැරකමක් විසර්ජන ගිණුමේ දක්වා තිබුණ ද එවැනි බැරකමක් ඇතිකර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැය ඇස්තමේන්තුවලින් දෙපාර්තමේන්තුව වෙත සලසා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (උ) | 2015 | 3.10.1 (අ) | 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 36 හා 37 වගන්ති ප්‍රකාරව දිවි නැගුම සංවර්ධන අරමුදල හා දිවි නැගුම චක්‍රීය අරමුදල පිහිටුවා නොතිබුණි. |
| (ඌ) | 2015 | 3.10.1 (ආ) (ii) | මුදල් රෙගුලාසි 763 ප්‍රකාරව ප්‍රධාන කාර්යාලයේ ගබඩා භාණ්ඩ සහ ලිපි ද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ තොග සම්බන්ධයෙන් ගබඩා ව්‍යවස්ථා සම්පාදනය කරගෙන නොතිබුණි. |
| (එ) | 2015 | 3.10.1 (ඇ) (ii) | 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92 (1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරීන්ට වෙන්කළ වාහන හැර අනිකුත් වාහනවල රාජ්‍ය ලාංඡනය සහ දෙපාර්තමේන්තුවේ නාමය යෙදීමට කටයුතු කර නොතිබුණි. |

**3.19 කළමනාකරණ දුර්වලතා**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 මැයි මාසයේ සිදු වු ගංවගුර හා නායයෑමෙන් ආපදාවට ලක් වු ජනතාවට ආහාර මිලදී ගැනීම සඳහා ලෝක ආහාර සංවිධානයෙන් 2016 ජුලි 05 දින සිට ඔක්තෝබර් 05 දින දක්වා ක්‍රියාකාරි කාලයකට අනුමත වී තිබු රු. මිලියන 265 ක ආධාරවලින් වර්ෂය අවසාන වන විටත් වැඩසටහන් ක්‍රියාත්මක කර අවසාන කිරීමට නොහැකි වීම හේතුවෙන් රු. මිලියන 113 කට ආසන්න ආධාර මුදලක් අහිමි වී තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා බෙදාදුන් රු.152,321,910 ක ආධාර මුදල් නියමිත පරිදි බෙදාහැර ඇති බවට එම කාර්යාල වලින් තහවුරු කිරීම් ලබාගෙන නොතිබුණි.

(ආ) දිවයින තුළ පිහිටි දිවි නැගුම ප්‍රජාමූල බැංකු 1074 ක් හා ප්‍රජාමූල බැංකු සමිති 331 ක් පවත්වාගෙන යනු ලබන ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. එම ගොඩනැගිලි 1,115 ක් පිහිටි ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව සතු නොවූවද එම ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවට අනුබද්ධ වු ආයතනවලින් පැවරුණු වාහන 30 ක් දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි කරගෙන නොතිබීම, නියැදි විගණන පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය වී තිබු වාහන 17 ක ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම, රියදුරන් අනුයුක්ත කර නොතිබු වාහන 15 ක් සඳහා ඉන්ධන නිකුත්කර තිබීම, ගේට්ටු අවසර පත් භාවිතා නොකිරීම, අදාළ වාහන සඳහා දෙපාර්තමේන්තුවේ නම හා රාජ්‍ය ලංඡනය නොයෙදීම යනාදී කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ වාහන පාලනය සතුටුදායක මට්ටමක නොතිබුණි.

(ඈ) සමෘද්ධි අධිකාරියේ 2013 වර්ෂයට පෙර ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති 18 ක අනාවරණය කරගෙන තිබු මුල්‍ය වංචාවන්හි වටිනාකම රු. 12,023,000 ක් ද, දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් අනතුරුව 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති 63 ක සිදුකර තිබු වංචාවන්හි වටිනාකම රු. 108,902,167 ක් ද විය. තවත් බැංකු හා බැංකු සමිති 25 ක සිදුකර තිබු මුල්‍ය වංචාවන්හි වටිනාකම් ගණනය කර නොතිබුණි.

(ඉ) ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනය නිමිති කර ගෙන පවත්වනු ලබන කොඩි අලෙවි වැඩසටහනින් රැස් කරන මුදලින් අඩු ආදායම්ලාභී දිළිඳු ජනතාවගේ ගැටළුවලට ආධාර උපකාර කිරීමේ අරමුණින් දිවි නැගුම ප්‍රජාමූල බැංකුවල පවත්වාගෙන යනු ලබන දිවි නැගුම සමාජ සංවර්ධන පදනම ව්‍යවස්ථාපිත කර එහි කාර්යයන් විධිමත් පරිදි සැලසුම් කිරීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට අරමුදලේ ශේෂය රු.218,278,603 ක් වී තිබුණි. තවද, නිශ්චිත අලෙවි මිලක් රහිතව කොඩි අලෙවි කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේදී රැස්කරගෙන තිබූ රු.229,625,062 ක ආදායමෙහි නිවැරදිතාවය ද සනාථ කිරීමට නොහැකි විය.

**3.20 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 72 | 87 | | 15 |
| (ii) තෘතියික මට්ටම | 2,581 | 28 | 2,553 | - |
| (iii) ද්විතියික මට්ටම | 21,193 | 23,612 | - | 2,419 |
| (iv) ප්‍රාථමික මට්ටම | 187 | 176 | 11 | |
| (v) වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 20 | - | 20 |
| **එකතුව** | **24,033** | **23,923** | **2,564** | **2,454** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිවි නැගුම සංවර්ධන නිලධාරී සේවාව හැරුණු විට අනෙකුත් සේවාවන් සඳහා සේවා ව්‍යවස්ථා හා තනතුරුවලට අදාළව බඳවාගැනීමේ පටිපාටි අනුමත කරගෙන නොතිබුණි. මේ නිසා බඳවා ගැනීම්, උසස් කිරීම් හා විශ්‍රාම ගැන්වීම් ආදී කාර්යයන් සිදු කිරීමටද දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ගිය සේවකයන් හා මියගිය සේවකයන් 155 දෙනෙකුට විශ්‍රාම ප්‍රතිලාභ ලබාගැනීමට ද නොහැකි වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් පිරිවිය යුතු දිවි නැගුම දිස්ත්‍රික් අධ්‍යක්ෂ තනතුරු 18 ක්, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ II හා III ශ්‍රේණිවලින් හා වැඩ බැලීමේ පදනම යටතේ රාජකාරි ආවරණය කරගෙන තිබූ අතර 2017 ජූලි මාසය වන විට දිස්ත්‍රික් කාර්යාල 21 ක ගණකාධිකාරි තනතුරු පුරප්පාඩු වී පැවතුණි.